29-11-2016

ක්‍රිස්තියානි ධර්මය 43. කථිකාචාර්ය, ශාස්ත්‍රපති. එරික් සිසිලන් ඩයස්. ඩී.ටී එච්. (ශ්‍රී ලංකාව), බී.ඒ. විශේෂ (ගෞරව) (රෝමය), එම්.ඒ. (ශ්‍රී ලංකාව). 77 7 85 35 35. ද මැසිනොද් විද්‍යාලය, කඳාන.

ද මැසිනොද් විද්‍යාලය, කඳාන - ශ්‍රී ලංකාව

# ක්‍රිස්තියානි ධර්මය

13 ශ්‍රේණිය - ප්‍රථම වාර පරීක්ෂණය - 2016 දෙසැම්බර්

**43**

1 පත්‍රය (බහුවරණ) | අ.පො.ස. උ/පෙළ විභාගය 2015 - 2017 | කාලය පැය 02 යි

නම: ........................................................................ පන්තිය: .................. විභාග/පන්ති අංකය: ..............

උපදෙස්:

- වරණ 5 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 50 කි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.
- නිවැරදි හෝ වඩාත් නිවැරදි (ගැළපෙන) පිළිතුර තෝරා, එහි වරණ අංකය තිත් ඉරි මත පමණක් සටහන් කරන්න.
- අපැහැදිලි හෝ එකකට වඩා සපයන ලද හෝ වෙනත් ක්‍රමයකට සටහන් කරන ලද හෝ පිළිතුරු ප්‍රතික්ෂේප වේ.

(01) ඊශ්‍රායෙල් ඉතිහාසය තුළ අනාවරණය වූ දේව ක්‍රියාකාරීත්වය හුදෙක් ක්‍රිස්තුන් වහන්සේ තුළින් පූර්ණත්වයට පත් වූ අයුරු ගෙනහැර දැක්වෙන්නේ...
1. 1 තිමෝති 3/15-17 මගිනි.
2. හෙබ්‍රෙව් 1/1-2 මගිනි.
3. නික්මයාම 20/1-17 මගිනි.
4. උත්පත්ති 1/1-2/4 මගිනි.
5. ජොහාන් 13/1-20 මගිනි. (..................)

(02) ග්‍රීක භාෂාවට පරිවර්තනය කරන ලද; ජුදා බයිබලයෙහි ප්‍රථම බාණ්ඩට අදාළ ග්‍රන්ථයක් වන්නේ,
1. මාක් සුභාරංචිය යි.
2. 1 තෙසලෝනික ලිපිය යි.
3. සළමොන්ගේ ප්‍රඥා පොත යි.
4. ගණන් කථාව ය.
5. ඩිඩාකේ ග්‍රන්ථය යි. (..................)

(03) පලස්තීනය අවට පිහිටි; අසිරියානු සහ බැබිලෝනියානු අධිරාජ්‍යයන් හුදෙක් ප්‍රධාන වශයෙන් ම නැකම් කීවේ...
1. මෙසපොතේමියානු ශිෂ්ටාචාරයට ය.
2. නයිල් නිම්න ශිෂ්ටාචාරයට ය.
3. යුප්‍රටීස් සහ ටයිග්‍රීස් නිම්න ශිෂ්ටාචාරයන්ට ය.
4. මිසර ශිෂ්ටාචාරයට ය.
5. සුමේරියානු ශිෂ්ටාචාරයට ය. (..................)

(04) 13 කලා පන්තියෙහි ඉගෙනුම ලබන; J. මයිකල් හේරත් නැමැති සිසුවා විසින් 'ඊශ්‍රායෙලීය වීරවරුන්' හා සැබැඳිව වගු ගතකොට ඇති අදහස් කිහිපයක් පහත දැක්වෙන පරිදි ගෙනහැර දැක්විය හැකිය.

**A.** සැම්සොන්.
**B.** එස්තර්.
**C.** ගිඩියොන්.
**D.** දෙබෝරා.

**E.** පිලිස්තිවරුන්ගෙන්, ඊශ්‍රායෙල් ජනතාව බේරා ගැනීම පිණිස නායකත්වය ගැනීම.
**F.** ඊශ්‍රායෙල් ජනතාවට විනිශ්චයෙන් සහය දැක්වීම.
**G.** මිදියන්වරුන්ගෙන් පැමිණි ආක්‍රමණවලින් ඊශ්‍රායෙල් ජනතාව ව මුදවා ගැනීම.
**H.** ඇය තුළ පැවති විශ්වාසය; ඇයගේ අපේක්ෂාව ජය ගැන්ම පිණිස ඉවහල් විය.

මයිකල්ගේ ඉහත ඉදිරිපත් කිරීමට අනුව; A,B,C,D මගින් ප්‍රකාශිත පුද්ගල නාමයන් හුදෙක් E,F,G,H යන අදහස් සමග පිළිවෙලින් සැසඳූ කල්හි දී; E,F,G,H ට අනුව, නිවැරදි පිළිතුරු අනුපිළිවෙලින් ඇතුළත් කොට ඇත්තේ...
1. E,H,G,F.
2. E,F,G,H.
3. G,F,E,H.
4. F,H,E,G.
5. G,H,E,F. (..................)

(05) නෙහෙමියා විසින්, 'ජෙරුසලම් පවුරු' යළි ගොඩනගනු ලැබුවේ...
1. පර්සියාවේ දාරියුස් රජුගේ කාලයේ දී ය.
2. බැබිලෝනියාවේ සයිරස් රජුගේ කාලයේ දී ය.
3. මිසරයේ සේතිය රජුගේ කාලයේ දී ය.
4. අසිරියාවේ 2 වන සාර්ගොන් රජුගේ කාලයේ දී ය.
5. රෝමයේ ටොලමි රජුගේ කාලයේ දී ය. (..................)

(06) සාවුල් රජුගේ රාජධානියෙහි කේන්ද්‍රස්ථානය වූයේ,
1. නෙගෙබ් කඳුකරයේ ඊසාන දිග ප්‍රදේශය.
2. මධ්‍යම කඳුකරයේ උතුරු ප්‍රදේශය.
3. ජුදා කඳුකරයේ ජෙරුසලම් ප්‍රදේශය.
4. දක්ෂිණ කඳුකරයේ නැගෙනහිර ප්‍රදේශය.
5. උත්තර කඳුකරයේ දකුණු ප්‍රදේශය. (..................)

(07) පලස්තීනයේ උත්තර රාජ්‍යයේ, රජකමට පත් වූ ප්‍රථම රජවරුන් පස් දෙනාව ඉතා දරුණු ලෙස මරුමුවට පත් කිරීමෙන් අනතුරුව සිහසුන පැහැරගනු ලැබුවේ...
1. සෙරුබ්බාබෙල් විසිනි.
2. ඔම්රි විසිනි.
3. දාරියුස් විසිනි.
4. සයිරස් විසිනි.
5. ජෙරබොවාම් විසිනි. (..................)

(08) උත්පත්ති 11/1-9 නැමැති විස්තරය මගින් කියැවෙන්නේ,
1. පාපය හේතුකොට ගෙන, මානව සහෝදරත්වය පළුදු වීමකි.
2. විශ්වය සහ මිනිසා මැවීම පිළිබඳව වූ දේව ධාර්මික ඉගැන්වීම් සමුදායකි.
3. මැවීමේ මුල් සිදුවීම, නැවත වතාවක් ආවර්ජනය කරනු ලැබීමකි.
4. මානව ව්‍යාප්තියට එරෙහිව මිනිසා, දේව අභිමතය කඩ කිරීමකි.
5. ලෝකයේ සිදු වූ ප්‍රථම මනුෂ ඝාතනය, දේව ධාර්මික වශයෙන් විවරණය කිරීමකි. (..................)

(09) තේරාගේ පුතුන් තිදෙනා වශයෙන් මෙහි දී ඔබට නම් කළ හැක්කේ, මොවුන් අතුරින්,
1. ඉස්සාකර්, සාබුලෝන්, දාන්.
2. සාරා, රෙබේකා, නප්තලී.
3. ආබ්‍රම්, නාහෝර්, හාරාන්.
4. ෂෙම්, හාම්, ජපෙත්.
5. ජෙරොබොවාම්, රෙහෙබොවාම්, ජොෂියා. (..................)

(10) 'ජෝසප් පිළිබඳව කිසිවක් නොදන්නා, 19 වන රාජ පරම්පරාවට අයත් රජ කෙනෙකු ක්‍රි.පූ. 1290-1224 පමණ කාලයේ දී මිසරයේ රජකමට පත් විය.'
ඓතිහාසික තොරතුරුවලට අනුව මොහු...
1. දෙවන වුටන්කාමන් පාරාවෝ ය.
2. ප්‍රථම සේතිය පාරාවෝ ය.
3. දෙවන රැමසෙස් පාරාවෝ ය.
4. දෙවන පීතොම් පාරාවෝ ය.
5. ප්‍රථම රැමසෙස් පාරාවෝ ය. (..................)

(11) මිසරය වෙත පැමිණි වූ පීඩන අතුරින්; 6, 7 සහ 8 වන වසංගත පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.
1. පළඟැටි උවදුර, ගල් වර්ෂා උවදුර සහ ගඩු උවදුර.
2. මැසි උවදුර, ගල් වර්ෂා උවදුර සහ සතුරු උවදුර.
3. කිනිතුළු උවදුර, ගඩු උවදුර සහ පළඟැටි උවදුර.
4. ගඩු උවදුර, ගල් වර්ෂා උවදුර සහ පළඟැටි උවදුර.
5. මැඩි උවදුර, මැසි උවදුර සහ ගල් වර්ෂා උවදුර. (..................)

(12) 'රතු මුහුද තරණය' නැමැති විස්තරය හුදෙක් පංච පුස්තකය තුළ විකාශණය වී ඇති සම්ප්‍රදායන් ද්විත්වයකි.
1. D සහ J.
2. J සහ E.
3. E සහ P.
4. D සහ E.
5. P සහ J. (..................)

(13) 'පාළුකරයේ ගමන තුළ, ඊශ්‍රායෙල් ජනයාට සර්පයන් දෂ්ඨ කළ විට .......................... ඔවුහු සුවය ලැබිය.'
මෙහි හිස්තැනට වඩාත් උචිත වන පිළිතුර තෝරන්න.
1. මෝසෙස් විසින් දෂ්ට කළ තුවාලය මත තම හස්තය තැබීමෙන්.
2. රිටක සිටවන ලද, ලෝහයෙන් තැනූ සර්පයා දෙස බැලීමෙන්.
3. කුඩාරම් මංගල්‍යය පවත්වා, දෙවියන් වහන්සේට කන්නලව් කිරීමෙන්.
4. ආලෝන ගසක් මිරිදිය ජලයට දමා, එම ජලය බොන්නට සැලැස්වීමෙන්.
5. මෝසෙස් තම දෑත් ජනතාව මත දිගු කිරීමෙන්. (..................)

(14) පුරාණ, පෙරදිග ලෝකයේ, දේශපාලනික හා සමාජීය ක්ෂේත්‍රවල පැවති ගිවිසුම්වල පැවති පොදු ලක්ෂණයක් වන්නේ,
1. ඒක පාර්ශවික එකගතාවය මත කොන්දේසීන් ස්ථාපිත කිරීම.
2. ගිවිසුම් ලියවිල්ලක් මඟින් කොන්දේසීන් ස්ථාපිත කරනු ලැබීම.
3. ස්ථිර සාක්ෂින් පවත්වාගෙන යනු සඳහා, තෙවන පාර්ශවයක් නම් කරනු ලැබීම.
4. කොන්දේසීන් පුරකිම පිණිස දෙවි කෙනෙකුව නම් කිරීම.
5. මෝසෙස්ගේ නීතියට අනුව, එම ගිවිසුම ලියාපදිංචි කොට, වලංගු කරනු ලැබීම. (..................)

(15) 'දිවැසිවරයා' යන අරුත ගෙන දීම පිණිස, ග්‍රීක බසින් භාවිතා කරනු ලබන වදනකි.
1. 'නබී' යන්න.
2. 'රෝ ඒ' යන්න.
3. 'ප්‍රොෆේටේස්' යන්න.
4. 'හො සේ' යන්න.
5. 'ප්‍රොෆටිස්' යන්න. (..................)

(16) ශාස්ත්‍රීය දිවැසිවරුන් ගණයට අයත් නොවන, දිවැසිවරයකු සහිත පිළිතුරු භාණ්ඩය තෝරන්න.
1. යෙසායා, දානියෙල්, මලාකි, ජෝනා.
2. සෙකරියා, මලාකි, එලියා, නාහුම්.
3. එසකියෙල්, හග්ගයි, හබක්කුක්, මීකා.
4. ජෝනා, මීකා, නාහුම්, ජෙරමියා.
5. යෙසායා, ජෙරමියා, එසකියෙල්, දානියෙල්. (..................)

(17) 'සාධාරණත්වයේ දිවැසිවරයා' යන අනුවර්ථන නාමයෙන්, බයිබල් විශාරදයෝ මොහුව නම් කරනු ලබයි. මොහු හුදෙක්,
1. යෙසායා ය.
2. ආමෝස් ය.
3. එසකියෙල් ය.
4. ජෙරමියා ය.
5. හොසියා ය. (..................)

(18) නව ගිවිසුම සමයේ දී ජුදයාව, සාමාරියාව හා ඉදුමීය යන ප්‍රදේශවල යුව රජු වශයෙන් කටයුතු කරන ලදැ'යි සැළකෙන්නේ හුදෙක්,
1. මහ හෙරෝද් ය.
2. හොරෝද් අර්කෙලාවුස් ය.
3. හෙරෝද් ඇන්ටිපස් ය.
4. දෙවන හෙරෝද් පිලිප් ය.
5. පොන්තියුස් පිලාත් ය. (..................)

(19) 'ප්‍රධාන සැන්හෙඩ්‍රින් සභාව .................. පිහිටා තිබූ අතර, මෙහි සාමාජිකයන් සංඛ්‍යාව .................. දෙනෙකුගෙන් සමන්විත විය.'
මෙහි හිස්තැනට සුදුසු පිළිතුරු ද්විත්වය පිළිවෙලින් දක්වා ඇති වරණය වන්නේ,
1. ජෙරුසලමෙහි - 71.
2. ජුදයාවෙහි - 75.
3. ගලීලයෙහි - 91.
4. රෝමයෙහි - 46.
5. ජෙරුසලමෙහි - 70. (..................)

(20) විශාරදයන්ගේ මතයට අනුව, 'ඩිඩාකේ ග්‍රන්ථය' රචනා කරන්නට ඇතැ'යි සැළකෙන්නේ,
1. පාවුළු තුමන් විසිනි.
2. සභා පියවරුන් විසිනි.
3. සභා ලේඛකයන් විසිනි.
4. අපෝස්තුරුවරුන් විසිනි.
5. ක්ෂමනවාදීන් විසිනි. (..................)

(21) සමදර්ශක සුවිශේෂවල සඳහන් නොවන සිදුවීමකි.
1. අංශභාගී රෝගියා සුව කිරීම.
2. ගලීලයේ සේවය.
3. උපවාසය පිළිබඳ ප්‍රශ්ණය.
4. තෝමස්ට දර්ශණය වීම.
5. ජෙරුසලමට ප්‍රවිශ්ඨ වීම. (..................)

(22) 'ද්විලේඛන සම්ප්‍රදාය' හා සබැඳිව ප්‍රථමවරට අදහස් දක්වන්නේ,
1. ක්‍රි.ව. 1892 දී, ජේ. වෙල්හවුසන් විසිනි.
2. ක්‍රි.ව. 1833 දී, ජේ. හොල්ස්මන් විසිනි.
3. ක්‍රි.ව. 1892 දී, ජේ. හොල්ස්මන් විසිනි.
4. ක්‍රි.ව. 1833 දී, ජේ. හුවයිස් විසිනි.
5. ක්‍රි.ව. 1892 දී, ජේ. හුවයිස් විසිනි. (..................)

(23) 'කන්ද උඩ දේශණාව' පිළිබඳව බුල්ට් මාන් නැමැති බයිබල් විශාරදයා හා සබැඳි සත්‍ය ප්‍රකාශය තෝරන්න.
1. උන්වහන්සේ, අරුම පුදුම දේ සිදු කළ බවයි.
2. උන්වහන්සේ, පව් කරුවන්ට සමාව දුන් බවයි.
3. උන්වහන්සේ, ගැළවුම්කරුවාණන් බවයි.
4. උන්වහන්සේ, නපුර ප්‍රතික්ෂේප කළ බවයි.
5. උන්වහන්සේ, දේව රාජ්‍ය ප්‍රකාශ කළ බවයි. (..................)

(24) මහා මංගල භෝජනය පිළිබඳ උපමාවට අනුව, ආරාධනය ප්‍රතික්ෂේප කළ අය වශයෙන් හැඳින්වෙන්නේ,
1. පරිසිවරුන් ය.
2. අයකැමියන් ය.
3. ජුදා ජාතිකයන් ය.
4. අන්‍ය ජාතිකයන් ය.
5. සමරිතානුවරුන් ය. (..................)

(25) ජේසුස් වහන්සේ සිදු කළ ප්‍රාතිහාර්යයන් අතුරින්, ස්වභාව ධර්මය පිට ආදිපත්‍යය පැතිරවීමේ සිද්ධීන් වශයෙන් ගෙනහැර දැක්විය හැක්කේ, පහත දැක්වෙන ඉදිරිපත් කිරීම් අතුරින් කුමන සිදුවීම් ද?
A. අශුද්ධ ආත්මයක් ආවේශ වූ මිනිසා සුවපත් කරනු ලැබීම.
B. අන්ධයින් දෙදෙනා සුවපත් කිරීම.
C. මාරුත දමනය.
D. පූප වැඩි කිරීමේ ප්‍රතිහාර්යය.
E. අංශභාග රෝගියා සුවපත් කරනු ලැබීම.
F. මුහුද මත ඇවිදීම.
G. ධර්ම ශාලාවේ සිටි යක්ෂාවේශ වූ මිනිසා සුවපත් කිරීම.
1. A, C සහ F ය.
2. B, C සහ E ය.
3. C, D සහ F ය.
4. D, E සහ G ය.
5. E, F සහ G ය. (..................)

(26) මාක් තුමාට අනුව; 'ජේසුස් වහන්සේ තමාව ප්‍රකාශ කරන්නට අකමැති වූ බැව් පෙනේ. තමා පිළිබඳව හෙළිදරව් නොකරන ලෙසට අණ කරණ ලදී'
මීට හේතුව වශයෙන්, විශාරද විල්හෙල්ම් රීඩ් විසින් ගෙනහැර දක්වනු ලබන්නේ,
1. ජනතාව ක්‍රමක් ක්‍රමයෙන් ඔවුන් වෙනුවෙන් වද වේදනා විඳ, මරණයට පත් කරන ලද ක්‍රිස්තුන් වහන්සේව අමතක කරනු ලැබීම නිසා ය.
2. නීරෝගේ දරුණු පීඩන වකවානුවක් තුළ මාක් සුභාරංචිය රචිත බැවින්, ජනතාව රහසිගතව දහම ඇදෙහූ නිසා, සුභාරංචිය කියවන පාඨකයා ද ජේසුස් වහන්සේව ප්‍රසිද්ධ කිරීම නොකළ යුතු බව පෙන්වා දීමට.
3. මෙය ව්‍යාංගාර්ථයෙන් ඉදිරිපත් කිරීමක් වන බැවි ය. එනම්, මතුපිට අර්ථයට වඩා එහි ගැඹුරු දේව ධර්මයක් අන්තර්ගත වන බව යි.
4. 'මෙසියානික රහස' වශයෙන් ඔහු මෙය හඳුන්වා දෙනු ලබයි.
5. ඉහත පිළිතුරු සියල්ල ඔහුගේ ප්‍රකාශණය තුළ අන්තර්ගත ය. (..................)

(27) 'උත්තම පූජක යැදුම' බෙදෙන කොටස් ත්‍රිත්වය අතුරින්; ප්‍රථම කොටස මඟින් කියවෙන්නේ, උන්වහන්සේ...
1. තමන් වහන්සේ උදෙසා; දෙවි පියාණන් ඉදිරියේ යාච්ඤා කළ බවයි.
2. බෞතීස්මය ලැබ, සභා සාමාජිකත්වයට දායක වන, සියළුම දේව ජනතාව වෙනුවෙන් යාච්ඤා කළ බවයි.
3. සභා පාලකයන් වෙනුවෙන් යාච්ඤා කළ බවයි.
4. දේව වචන අදහා; දෙවියන් වහන්සේ වෙතට යොමුවන සියල්ලන් වෙනුවෙන් යාච්ඤා කළ බවයි.
5. වර්ණ, ජාති, ආගම්, කුල භේද නොතකා... ලෝවැසි සියල්ලන් වෙනුවෙන් යාච්ඤා කළ බවයි. (..................)

(28) 'පාද දෝවනය කිරීම' නැමැති සිද්ධිය හුදෙක් ................................ හිස්තැන් පුරවන්න.
1. මාක්, මතෙව් හා ලූක් යන සුභාරංචිවල සඳහන් වන නමුදු, ජොහාන් සුභාරංචියේ මෙය සඳහන්ව නැත.
2. සඳහන්ව ඇත්තේ; ජොහාන් සුභාරංචියෙහි පමණකි.
3. මතෙව් හා ලූක් සුභාරංචි ද්විත්වයෙහි පමණක්, මෙය සඳහන් ය.
4. මාක් හැර, අන් සියළුම සුභාරංචියන් හි මෙම විස්තරය සඳහන් ව ඇත.
5. මාක්, මතෙව් ලූක් සහ ජොහාන් යන සුභාරංචි හතරේම සඳහන් ය. (..................)

(29) මාක් තුමාගේ ඉදිරිපත් කිරීමට අනුව, තමන් වහන්සේට විරුද්ධව කරන ලද චෝදනා වලදී උන්වහන්සේ කිසිත් ප්‍රකාශ නොකොට නිහඬව සිටියේ...
1. රෝම අධිරාජ්‍යයට කරුණු ඉදිරිපත් කිරීම, නිෂ්ඵල ක්‍රියාවක් වන බැවිනි.
2. දේව කැමැත්තට අවනත වීම, හුදෙක් තම නිදහසට කරුණු ඉදිරිපත් කිරීමට වඩා වැදගත් වූ බැවිනි.
3. තමන් වහනසේ දේව පුත්‍රයා වූ බැවින්, පාපී මනුෂ අධිකරණයක් ඉදිරියේ කරුණු ගෙනහැර දැක්වීම දේව අභිමතය නොවන බැවිනි.
4. තමන් වහන්සේ කිසිත් ප්‍රකාශ කලත්, එම ප්‍රයත්නය සාර්ථක නොවන බැව් උන්වහන්සේ දන්නා බැවිනි.
5. දේව අභිමතය වන්නේ, තමන් වහන්සේ දුක් විඳ, මරණය ලැබ විජයග්‍රාහී ලෙස උත්ථාන විය යුතු බැව් දන්නා බැවිනි. (..................)

(30) 'අරමතියාවේ ජොශප්' හා සබැඳි, මින් අසත්‍ය ප්‍රකාශය තෝරන්න.
1. මොහු පිළිබඳව, මාක් තුමා වැඩි විස්තරයක් නොකරයි.
2. මොහු, ජේසුස් වහන්සේගේ අනුගාමිකයෙකි.
3. ජුදෙව්වරුන්ගේ ක්‍රියා කලාප අනුමත නොකල පුද්ගලයෙකි.
4. ජේසුස් වහන්සේගේ දේහය භූමදානය කිරීම පිණිස, ගල්ලෙනක් පරිත්‍යාග කලේ මොහුය.
5. මොහු, සැන්හෙඩ්‍රියන් ජුදා මන්ත්‍රණ සභාවේ සිටි එකම අන්‍ය ජාතිකයා ය. (..................)

(31) ..................... හා ..................... හුදෙක් ශුද්ධාත්මයාණන් වහන්සේව සංකේතවත් කරනු ලබයි. හිස්තැනට වඩාත් සුදුසු පිළිතුරු ද්විත්වය සහිත වරණය තෝරන්න.
1. සුළඟ සහ ජීවන හුස්ම.
2. ගින්න සහ සැඩ සුළඟ.
3. ගින්න සහ ගිනි දිව්.
4. සැඩ සුළඟ සහ ආත්මය.
5. ජීවන හුස්ම සහ ජලය. (..................)

(32) 'සති මංගල්‍යය' හා සබැඳි, මින් සත්‍ය ප්‍රකාශය තෝරන්න.
1. මෙය, '50 වන දින මංගල්‍යය' වශයෙන් ද හැඳින්වේ.
2. මෙය, වසර 50 ක කාලයක් තුළ, පාළුකරයෙහි ගත කල ජීවිතයේ විජයග්‍රාහී අත්දැකීම් ආවර්ජනය කිරීමකි.
3. මෙය, '50 වන සකි මංගල්‍යය' වශයෙන්ද හඳුන්වනු ලබයි.
4. මෙය, හුදෙක් ජුදයන්ගේ ප්‍රධාන පංචවිධ මංගල්‍යයන්ගෙන් එකකි.
5. මෙය, හුදෙක් නව ගිවිසුමේ 'පෙන්තකොස්ත මංගල්‍යය' යි. (..................)

(33) 'පේදුරු තුමා විසින් ................. ශුද්ධාත්ම මග පෙන්වීමට අනුව, ප්‍රථම වරට අන්‍ය ජාතිකයෙකු වූ ................. හා ................., ඔහුගේ මිතුරන්ව ද සභාව ට එක් කළේ ය.'
නිවැරදි පිළිතුරු පිළිවෙලින් පෙළ ගැස්සූ විට, අදාල වරණය වන්නේ,
1. කයිසාරියේ දී, ශතාධිපති කොරනේලියස්, පවුලේ අය.
2. ජොප්පාවේ දී, එතෝපීය නපුංසකයා, සභා සාමාජිකයන්.
3. අන්තියෝකයේ දී, ශතාධිපති කොරනේලියස්, ජුදා සසුනේ සාමාජිකයින්.
4. කයිසාරියේ දී, අනනියස් සහ සපිරා, පවුලේ අය.
5. සාමාරියාවේ දී, ශතාධිපති කොරනේලියස්, පවුලේ අය. (..................)

(34) ජෙරුසලම් මන්ත්‍රණ සභාව මගින් ගනු ලැබූ තීරණ අතුරින් ප්‍රධාන තීරණයකි.
1. ජුදා චාරිත්‍ර වාරිත්‍ර හා සමග සබැඳි වූ නව නීති රීතීන් මාලාවක් පණවනු ලැබීම.
2. විජාතිකයන්ට; ශුද්ධ වූ සභාවට ඇතුළත් වීමේ අවස්ථාව සලසා දෙනු ලැබීම.
3. චර්මච්ඡේදනය හා බෞතීස්ම ස්නාපන පිළිවෙත් හුදෙක් වඩාත් විධිමත් කරනු ලැබීම.
4. අන්‍ය ජාතිකයන් සභාවට ඇතුළත් කොට ගැනීම හුදෙක් දැඩි නීති රීතීන් හමුවේ සිදු කරනු ලැබීම.
5. ජුදා ජාතිකයන්, කිතුණු දහමට ඇතුළත් කොට ගැනීම, සීමා සහිත කරනු ලැබීම. (..................)

(35) ශුද්ධ වූ ස්තේපන් තුමා හා සබැඳි මින් අසත්‍ය ප්‍රකාශය තෝරන්න.
1. ශුද්ධ ස්ථානයට හා ව්‍යවස්ථාවට විරුද්ධව කථා කිරීම; මොහුට එරෙහිව ඉදිරිපත් වූ චෝදනා අතුරින් එකකි.
2. තමන්ට ගල් ගැසූ අය වෙනුවෙන් යාච්ඤා කරමින්, හෙතෙම තම දිවි පුද කලේ ය
3. හෙතෙම, සභාව තුළ සමාජ සේවා කටයුතුවල නියැළුණ දියෝකෝනවරයෙකි.
4. දහම් දෙසුම, බෞතීස්ම ස්නාපනය ලබා දීම, සුව දානය... මොහුගේ කාර්යයන් අතුරින් සමහරෙකි.
5. මොහුගේ පිළිතුරු කථාවට පාදක වූයේ හුදෙක්, පෙන්තකොස්ත දින ශුද්ධාත්ම දානය යි. (..................)

(36) පාවුළු තුමාගේ තෙවන ධර්මදූත චාරිකාව හා සබැඳි 'සිදු වූ කාලය, ඊට සහභාගී වූවෝ සහ අදාල ස්ථාන' හුදෙක් පිළිවෙලින් දක්වා ඇති, නිවැරදි වරණය තෝරන්න.
1. ක්‍රි.ව. 50 - 52 දක්වා, සීලස් තිමෝතියස් හා ලූක්, සිරියාව සිසිලියාව දර්භය ආශ්‍රිත නගර.
2. ක්‍රි.ව. 53 - 55 දක්වා, තිමෝතියස් තීතස් හා ජොහාන් මාක්, ගලාතිය පර්ගාය සහ මැසිදෝනිය ආශ්‍රිත ප්‍රදේශ.
3. ක්‍රි.ව. 54 - 58 දක්වා, තිමෝතියස් හා තීතස්, ගලාතිය පර්ගාය සහ මැසිදෝනිය ආශ්‍රිත ප්‍රදේශ.
4. ක්‍රි.ව. 52 - 54 දක්වා, සීලස් හා ජොහාන් මාක්, සයිප්‍රසය සිසිලියාව සහ සුළු ආසියා නගර.
5. ක්‍රි.ව. 46 - 49 දක්වා, බර්නබස් හා ජොහාන් මාක්, සයිප්‍රසය ගිණිකොන පළාත් සහ සුළු ආසියා නගර. (..................)

(37) 'මළා වූ අය නැවත නැගිටීම' හා සබැඳි වූ සැකය හෝ ගැටළුව හුදෙක් මූලික වශයෙන් හටගත්තේ ?.
1. ගලාතිවරුන් සහ තෙසලෝනිකවරුන් අතර ය.
2. කොරෙන්තිවරුන් සහ රෝමවරුන් අතර ය.
3. ගලාතිවරුන් සහ කොරෙන්තිවරුන් අතර ය.
4. තෙසලෝනිකවරුන් සහ කොරෙන්තිවරුන් අතර ය.
5. එපීසවරුන් සහ ගලාතිවරුන් අතර ය. (..................)

(38) පාවුළු ඉගැන්වීම්වලට අනුව, 'ශුද්ධාත්ම දීමනා' වැඩි ප්‍රමාණයක් අඩංගු වන වරණය තෝරන්න.
1. ප්‍රඥාව, කීකරු කම, දැන ගැන්ම, ධෛර්යය, දේව භය.
2. ප්‍රේමය, දේව භක්තිය, ප්‍රීතිය, ප්‍රඥාව, විශ්වාසවන්තකම.
3. තේරුම් ගැනීම, ආත්ම ධමනය, මෘදු කම, ධෛර්යය, ප්‍රඥාව.
4. දැනුමැතිකම, දේව භය, කීකරුකම, ප්‍රඥාව, ඉවසීම.
5. දේව භය, මෘදු කම, තේරුම් ගැනීම, ඉවසීම, දැන ගැන්ම. (..................)

(39) පහත දැක්වෙන A,B,C,D,E මගින් ඉදිරිපත් කොට ඇති වදන්; F,G,H,I,J හි සඳහන් කොට ඇති අරුත් සමග සසඳන්න.

A. තෙයුමා.
B. කාරිස්.
C. අගපේ.
D. පරූසියා.
E. කරිස්මා.
F. ක්‍රිස්තුන් වහන්සේගේ දෙවන පැමිණීමේ දවස.
G. ආත්මය.
H. ප්‍රේමය.
I. දීමනා.
J. දේව වරප්‍රසාදය.

එම ගැළපුමට අනුව, නිවැරදි පිළිතුර සහිත වරණය වන්නේ,

1. F,H,G,I,J.
2. J,H,G,I,F.
3. I,H,J,G,F.
4. G,J,H,F,I.
5. H,J,G,F,I.

(..................)

(40) රෝම අධිරාජ්‍යය තුළ; සියවස් 2-3 ක පමණ කාලයක් තිස්සේ කිතුණුවන්ට එරෙහිව පැවති දරුණු පීඩන කාලය නිමාවට පත් වන්නේ හුදෙක්,

1. වැල්දියන් අධිරාජ්‍යයාගේ පාලනය හා ස්ටොයික් ආඥාවත් සමග ය.
2. කොන්ස්තන්තීනු අධිරාජ්‍යයාගේ පාලනය හා මිලාන් ආඥාවක් සමග ය.
3. ඇලෙක්සැන්ඩ්‍රියානු අධිරාජ්‍යයාගේ පාලනය හා රෝම ආඥාවත් සමග ය.
4. රෝම අධිරාජ්‍යයාගේ පාලනය හා කොන්ස්ටන්ටයින් ආඥාවත් සමග ය.
5. පොම්පේ අධිරාජ්‍යයාගේ පාලනය හා පාදෝ-ආදෝ ආඥාවත් සමග ය.

(..................)

(41) මුල් සියවස් කිහිපය ආශ්‍රිතව සභාව තුළ හටගත් 'ගැටළු සහ මතභේදයන්'ට තුඩුදුන් මූලික කාරණාව වූයේ; සභාව තුළින් ම හටගත්...

1. ධර්මය සහ විනය නීති රීතීන් පිළිබඳ වූ ගැටළු ය.
2. ජනවන්දනාව සහ ධර්ම නීති-රීතීන් පිළිබඳ වූ ගැටළු ය.
3. දර්ශනවාදය සහ ධර්ම නීති-රීතීන් පිළිබඳ වූ ගැටළු ය.
4. විනය සහ ජනවන්දනා නීති රීතීන් පිළිබඳ වූ ගැටළු ය.
5. ස්ටොයික් වාදය සහ ධර්ම නීති රීතීන් පිළිබඳ වූ ගැටළු ය.

(..................)

(42) මන්ත්‍රණ සභාවක් පැවැත්වීම හා සබැඳිව; ශුද්ධෝත්තම පියතුමන්ගේ ප්‍රධාන කාර්යයන් දැක්වෙන නිවැරදි වරණය තෝරන්න

1. සභාවක් කැඳවීම, විසුරුවා හැරීම සහ එය පවත්වාගෙන යාම ය.
2. සභා සැසියන් සඳහා සහභාගී වීම, මෙහෙයවීම සහ සභාව විසුරුවා හැරීම ය.
3. සභාවක් කැඳවීම පිණිස යෝජනා කිරීම, ඒ සඳහා අනුමැතිය ලබා දීම සහ මෙහෙයවීම ය.
4. සභාවක් පැවැත්වීම, මෙහෙයවීම සහ නිල ලේඛනයන් සඳහා අත්සන් කිරීම ය.
5. සභාවක් කැඳවීම, මෙහෙයවීම සහ එය අනුමත කිරීම ය.

(..................)

(43) ශුද්ධෝත්තම පියතුමන්ගේ අනුමැතියකින් තොරව කැඳවනු ලබන මන්ත්‍රණ සභා හඳුන්වනු ලබන්නේ හුදෙක්,

1. 'සොරුන්ගේ මන්ත්‍රණ සභා' වශයෙනි.
2. 'මූලධර්මවාදීන්ගේ මන්ත්‍රණ සභා' වශයෙනි.
3. 'දූර්මතධාරීන්ගේ මන්ත්‍රණ සභා' වශයෙනි.
4. 'අධිරාජ්‍යයන්ගේ මන්ත්‍රණ සභා' වශයෙනි.
5. 'වේද-භේදකාරීන්ගේ මන්ත්‍රණ සභා' වශයෙනි.

(..................)

(44) ක්‍රි.ව. 4 වන සියවස තෙක්; සභාවන්හී ප්‍රාදේශීය මට්ටමින් ගැටළු සාකච්චා කොට ඒවා නිරාකරනය කර ගැන්ම සඳහා, සභා නායකයන් එක් වී පවත්වනු ලබන මන්ත්‍රණ සභා විශේෂය හඳුන්වනු ලබන්නේ,

1. 'ප්‍රාදේශීය සභා සංසද' වශයෙනි.
2. 'ප්‍රාදේශීය කාරක ක්‍රියාකාරී සංසද' වශයෙනි.
3. 'ප්‍රාදේශීය මහ සභා නියෝජ්‍ය සංසද' වශයෙනි.
4. 'ප්‍රාදේශීය රදගුරු සංසද' වශයෙනි.
5. 'ප්‍රාදේශීය ධර්ම සජ්ජායනා සංසද' වශයෙනි.

(..................)

(45) සභාව තුළ; නෙස්ටෝරියස්ගේ ප්‍රධාන වේද-භේදකාරී මතය බවට පත් ව තිබුනේ...

1. 'ක්‍රිස්තුන් වහන්සේ තුළ සම්පූර්ණ දේව ස්වාභාවයක් සහ හීනවන මනුෂ්‍ය ස්වාභාවයක් ද පවතින බව යි.
2. 'ක්‍රිස්තුන් වහන්සේ යනු; දෙවියන් වහන්සේගේ තවත් එක් මැව්ල්ලක් පමණක් බව යි.
3. 'ක්‍රිස්තුන් වහන්සේ තුළ දේව හා මනුෂ්‍ය ස්වාභාවයන් වෙන් වෙන් වශයෙන් පවතින බව යි.
4. 'ක්‍රිස්තුන් වහන්සේ තුළ ඇත්තේ එක ම පෞරුෂයක් පමණක් බව යි.
5. 'ක්‍රිස්තුන් වහන්සේ දේව සහ මනුෂ්‍ය ස්වාභාවයන් ද්විත්වය, එකට සංකලණාත්මකව පවතින බව යි.

(..................)

(46) 'කැල්සිඩොන් මන්ත්‍රණ සභාව' (ක්‍රි.ව. 451) පවත්වන ලද්දේ; මූලික වශයෙන් ම,
1. මැනිකිසම් වාදය හා සබැඳිව ය.
2. එව්කේකියන් වාදය හා සබැඳිව ය.
3. ඒරියාන් වාදය හා සබැඳිව ය.
4. ඩොසෙතිස්සම් වාදය හා සබැඳිව ය.
5. නෙස්ටෝරියානු වාදය හා සබැඳිව ය. (..................)

(47) 'පිළිවෙලින්... මොහු ග්‍රීක සභා පියවරයෙකි. අනෙකා, හුදෙක් ලතින් සභා පියවරයෙකී' නිවැරදි පිළිතුරු සහිත වරණය තෝරන්න.
1. හිලරි තුමා සහ බැසිල් තුමා.
2. ඇතනේසියස් තුමා සහ ඇලෙක්සැන්ඩ්‍රියාවේ සිරිල් තුමා.
3. අන්තියෝකයේ අතනාසියුස් තුමා සහ ඉරනේයුස් තුමා.
4. ජස්ටින් තුමා සහ ජෙරොම් තුමා.
5. මහා ග්‍රගරි තුමා සහ ග්‍රගරි නසියන්සස් තුමා. (..................)

(48) සභා පිය යුගය වශයෙන් හැඳින්වෙන්නේ...
1. ක්‍රි.ව. 1-7 දක්වා වූ කාල පරිච්ඡේදය යි.
2. ක්‍රි.ව. 10-12 දක්වා වූ කාල පරිච්ඡේදය යි.
3. ක්‍රි.ව. 1-3 දක්වා වූ කාල පරිච්ඡේදය යි.
4. ක්‍රි.ව. 1-10 දක්වා වූ කාල පරිච්ඡේදය යි.
5. ක්‍රි.ව. 1-8 දක්වා වූ කාල පරිච්ඡේදය යි. (..................)

(49) සභා පියවරුන් පිළිබඳව අධ්‍යනය යනු;
1. විශ්වාසය තුල දෙවිඳුන් පිළිබඳව වූ දැණුම, වර්ධනය කරනු ලබන විද්‍යාවකි.
2. විධිමත් ක්‍රම වේදයන් පදනම් කොට ගෙන, ධර්මය පහදා දීමේ බල අධිකාරියකි.
3. ශ්‍රද්ධාව තුල, දෙවියන් වහන්සේ පිළිබඳ ව කරනු ලබන දේව ධාර්මික අධ්‍යනයකි.
4. ශුද්ධවන්ත විර ලේඛක චරිත කිහිපයක් පිළිබඳව, කරනු ලබන දේව ධාර්මික නමෳයතාවයකි.
5. ඇදහීම තුල සත්‍ය සොයා ගමන් අරඹනු ලබන, ඇදහිල්ලේ ගමනකි . (..................)

(50) පහත දැක්වෙන A,B,C,D,E,F,G මගින් ඉදිරිපත් කොට ඇති 'සභා පිය නාමයන්' හුදෙක්; H,I,J,K,L,M,N හි සඳහන් කොට ඇති; ඔවුන් විසින් රචිත 'සභා පිය ග්‍රන්ථයන්' සමග සැසඳීමක යෙදෙන්න.

A. අගුස්තීනු තුමා.
B. ජෙරොම් තුමා.
C. තර්තුලියන් තුමා.
D. ඇලෙක්සැන්ඩ්‍රියාවේ සිරිල් තුමා.
E. ඔරිගන්.
F. ජස්ටින් තුමා.
G. ඇතනේසියස් තුමා.

H. විශිෂ්ඨ පුද්ගලයන්ගේ චරිත.
I. හෙක්ස්සප්ලා.
J. පාපොච්චාරණය.
K. පරිච්ඡේද පත.
L. රෝම සෙනෙට් සභාවට ලියූ ඇපලොජිස්ත ලේඛනය.
M. De Decretis Nicaenae Synodi.
N. ඇපොලොජෙටිකුස්.

මෙම ගැළපුමට අනුව; H,I,J,K,L,M,N මගින් ප්‍රකාශිත නිවැරදි පිළිතුර සහිත වරණය විය හැක්කේ...
1. J,H,M,K,I,L,N.
2. K,J,N,H,I,L,M.
3. H,J,N,M,K,L,I.
4. J,H,N,K,I,L,M.
5. L,J,N,K,I,M,H. (..................)

(ලකුණු 2 × 50 = 100 යි)

*********************

29 - 11 - 2016

ක්‍රිස්තියානි ධර්මය 43. කථිකාචාර්ය, ශාස්ත්‍රපති. එරික් සිසිලන් ඩයස්. ඩී.ටී එච්. (ශ්‍රී ලංකාව), බී.ඒ. විශේෂ (ගෞරව) (රෝමය). එම්.ඒ. (ශ්‍රී ලංකාව). 77 7 85 35 35. ද මැසිනොද් විද්‍යාලය, කඳන.

ද මැසිනොද් විද්‍යාලය, කඳන - ශ්‍රී ලංකාව

# ක්‍රිස්තියානි ධර්මය

13 ශ්‍රේණිය - ප්‍රථම වාර පරීක්ෂණය - 2016 දෙසැම්බර්

43

2 පත්‍රය (බහුවරණ) | අ.පො.ස. උ/පෙළ විභාගය 2015 - 2017 | කාලය පැය 03 යි

නම: ................................................................ පන්තිය: .................. විභාග/පන්ති අංකය: ..............

Learning Resource Centre
De Mazenod College
Kandana

උපදෙස්:

- ➢ මෙහි I හා II වශයෙන් කොටස් ද්විත්වයකි. I කොටසින් කෙටි ප්‍රශ්න දෙකක් ද, II කොටසින් රචනාමය ප්‍රශ්න තුනක් ද වශයෙන් තොරා ගනිමින්, සම්පූර්ණ ප්‍රශ්න පහක් සඳහා පමණක් පිළිතුරු සපයන්න.
- ➢ පිළිතුරු සාර්ථක කොට ගැන්ම සඳහා, බයිබල් පාඨ උපුටා දැක්වීම් සහ නිදර්ශණ යොදා ගන්න.
- ➢ අත් අකුරු පැහැදිලි වන සේ පිළිතුරු සැපයීම කරන්න.

## I කොටස

(01)
1. සාමාරියාවට අයත් අනු නගර සතරක් නම් කරන්න.
2. උත්පත්ති පොතට අනුව, පාපයේ විපාක හේතුකොට ගෙන සමතුළිතත්වය බිඳී ඇති ආකාරය කරුණු සතරක් යටතේ ගෙනහැර දක්වන්න.
3. සෙකරියා 9/9-10 ට අනුව, සාමයේ කුමාරයාණන්ගේ ආගමනයෙහි ඇති ප්‍රධාන කරුණු සතරක් ලියා දක්වන්න.
4. ජෙරුසලම් මන්ත්‍රණ සභාව විසින්, අන්තියෝකීය සභාව වෙතට ලියා යැවූ හසුනෙහි අන්තර්ගත ප්‍රධාන කරුණු සතරක් ලියා දක්වන්න.
5. ක්‍රි.ව. 325-451 දක්වා සභාව තුළ පවත්වා ඇති, 'ක්‍රිස්තුවේදීය මන්ත්‍රණ සභා' සතරක් නම් කොට දක්වන්න.

(02)
1. පලස්තීනයේ, භූගෝල කලාප අතර පිහිටි 'මුහුදු තීරය' සමන්විත වී ඇති ප්‍රධාන තැනිතලාවන් සතරක් ලියා දක්වන්න.
2. මාක් සුභාරංචියට ආවේනික ලක්ෂණ සතරක් ඉදිරිපත් කරන්න.
3. 'ස්වාමිවාක් ආරාධනාව' හා 'උත්තම පූජක යාච්ඤාව' අතර පවතින සමානකම් සතරක් ගෙනහැර දක්වන්න.
4. එපීය මන්ත්‍රණ සභාවේ දී, ගත් තීරණ සතරක් ලියා දක්වන්න.
5. ඇලෙක්සැන්ඩ්‍රියාවේ සිරිල් තුමාගේ ලේඛනකරණය කරුණු සතරක් යටතේ ලියා දක්වන්න.

(03)
1. යෙසායා දිවැසිවරයා දිරිපත් කරන ආකාරයට, මෙසියස් තුමාගේ සුලක්ෂණ සතරක් නම් කොට දක්වන්න.
2. ප්‍රාතිහාර්යයක් යනු, කුමක්දැ'යි කරුණු සතරක් යටතේ පෙන්වා දෙන්න.
3. මාක් තුමා පෙන්වා දෙන ආකාරයට, ජේසුස් වහන්සේගේ දුක් ප්‍රාප්තිය බෙදෙන ප්‍රධාන කොටස් සතර ලියා දක්වන්න.
4. පාවුළු තුමාගේ දෙවන ධර්මදූත චාරිකාව හා සබැදි, 'පිලිප්පියේ සිදු වූ වැදගත් සිදුවීම්' සතරක් ඉදිරිපත් කරන්න.
5. මුල් යුගයේ විසූ කිතුණු ලේඛකයෙකු 'සභා පියෙකු' වශයෙන් නම් කිරීමේ දී සලකා බැලෙන ප්‍රධාන කරුණු සතරක් ලියා දක්වන්න.

(ලකුණු 4 × 5 = 20 යි)

## II කොටස

(04)
1. නිසියානු මන්ත්‍රණ සභාව, විනය නීති රීතින් පිළිබඳව ගත් තීරණ පහක් ලියා දක්වන්න.
2. කිතුණු සභාව සහ එහි ආරම්භක අවධිය යනු, කුමක්දැ'යි වචන 120 කින් පමණ විස්තර කොට, මෙම යුගය හා සබැඳිව තොරතුර සපයා ගත හැකි වැදගත් මූලාශ්‍රයන් පහක් ද නම් කොට දක්වන්න.

(05)
1. අපර විප්‍රවාසී යුගයේ දී සෙරුබ්බාබෙල්ගේ දායකත්වය වචන 120 කින් පමණ විස්තර කොට දක්වන්න.
2. ජුදෙව් පසුබිම තුළ කිතුණු සසුන හැඩගැසුණු අන්දම, හුදෙක් වචන 200 කින් පමණ විස්තර කොට දක්වන්න.

(06)
1. යෙසායා 7/10-17 මගින් ඉදිරිපත් කරනු ලබන, 'එම්මානුවෙල් නම් ලකුණ' නැමැති විස්තරය හා සබැඳිව වචන 120 කින් පමණ විස්තර කොට දක්වන්න.
2. සතරවන ඇන්ටියෝකස් එපිපානෙස් විසින්, ග්‍රීක අධිරාජ්‍යය වාදය යටතේ ජුදාවරුන්ව හෙලනිස්තකරණයට ලක් කල අන්දම වචන 120 පමණ විස්තර කොට දක්වන්න.

(07)
1. පාවුළු තුමාගේ තෙවන ධර්මදූත චාරිකාව හා සබැඳි 'එපීසියේ සිදු වූ වැදගත් සිදු වීම්' පහක් විස්තර කොට දක්වන්න.
2. 'මතෙව් සහ ලූක් යන සුභාරංචි කතුවරුන් ගෙනහැර දක්වනු ලබන, 'කන්ද උඩ දේශණාව' හුදෙක් නව ගිවිසුමේ ගිවිසුම් ව්‍යවස්ථාව යි' මෙම කියමන වචන 200 කින් පමණ විස්තර කොට දක්වන්න.

*** 4/AL-2017/13/2016-1/43/S ***

සියළුම හිමිකම් ඇවිරිණි.



Lecturer, Mas. Eric Sisilan Dias. D.Th. (Sri Lanka), B.A. Sp. (Hon's) (Rome), M.A. (Sri Lanka).